## ඉතාලියේ පැසිස්ට්වාදය

පැසිස්ට් චින්තනයේ ප්‍රධානතම අංගය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ඉතාලියේ මුසෝලනී විසින් පෙන්වා දුනි. එනම්, සිද්ධාන්ත හෝ කථාව හෝ නොව විනයගරුක බව හා ක්‍රියාත්මක වී ම පමණක් අවශ්‍ය බව යි. පළමුවන ලෝක යුද්ධයෙන් පසු ව සෙසු රටවල් මෙන් ම ඉතාලිය ද වියවුල්කාරී තත්ත්වයක පසුවෙද්දී බෙනිටෝ මුසෝලනී එරට බලයට පත් විය.



රූපය 4.5
ඇඩොල්ෆ් හිට්ලර් හා බෙන්ටෝ මුසෝලනී

ඔහු ක්‍රි.ව. 1921 දි පැසිස්ට් පක්ෂය පිහිටුවා ගත්තේ ය. පැසිස්ට් පක්ෂය ජාතිමාමක පක්ෂයකි. සිය පුවත් පත මඟින් කොමියුනිස්ට්වාදය දැඩි ව විවේචනය කළ මුසෝලනී එමඟින් තමන්ට පක්ෂපාතී පිරිස වර්ධනය කර ගත්තේ ය. කර්මාන්ත ශාලා සහ ඉඩම් හිමියන් මුසෝලනී පක්ෂයට ආධාර කළ අය අතර වූහ. ඔහුගේ පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත්තේ විරැකියාවෙන් හෙම්බත් වී සිටි දාමරිකයන් හා තරුණයන් ය. "කළු කමිස හමුදාව" නමින් හැඳින්වූ මොවුහු කළු කමිස හැඳගෙන නිරතුරු ව ම යෂ්ටියක් අතින් රැගෙන, මහත් බල පරාක්‍රමයක් විදහා දැක්වූහ. ඔවුහු මුසෝලනී ප්‍රතිපක්ෂ වූ වෘත්තිය සංගම් කාර්යාල කුඩුපට්ටම් කොට දැමූහ.

රජයේ නිලධාරීන්ගෙන් මුසෝලනීට විරෝධතා මතු නොවුණේ, රජයට කොමියුනිස්ට්වරුන්ගේ තර්ජනය තිබූ බැවිනි. විරැකියාව නැති කිරීම, කම්කරුවන්ගේ සේවා තත්ත්වය දියුණු කිරීම, ඉඩම් නැති ගොවියන්ට ඉඩම් ලබාදීම, පෞද්ගලික දේපළ හා ව්‍යාවසායකයින් ආරක්ෂා කිරීම වැනි ජනප්‍රිය වැඩ සටහන් ඉදිරිපත් කරනු ලැබී ය.

එහෙත් පළමු මැතිවරණයෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලය තුළ ඔහුට දිනා ගත හැකි වූයේ ආසන ඉතා ස්වල්පයක් පමණි. ඉතාලිය තුළ ශක්තිමත් ආණ්ඩුවක් පිහිටු වීමෙන් ලෝකයේ ජාතීන් අතර සාධාරණ ස්ථානයක් ඉතාලියට ලබා ගැනීමේ අවංක උත්සාහයක් මුසෝලනී තුළ විය. එහෙත් මැතිවරණ ප්‍රතිඵල මුසෝලනී අධෛර්යමත් කෙළේ ය. ඉන් නොවසිලිමත් ව මුසෝලනී නැවත මැතිවරණයක් පවත්වන ලෙස කළ ඉල්ලීම ප්‍රතික්ෂේප විය. ඒ නිසා ආණ්ඩු බලය තමන්ට පවරන මෙන් ඉල්ලා සිටි ඔහු, එය ලබා නොදුනහොත් පෙළපාලි මඟින් රෝම නගරය අල්ලා ගන්නා බවට තර්ජනය කෙළේ ය.

ඉතාලි රාජ්‍යය ඔහුගේ තර්ජනය කෙරෙහි සැලකිල්ලක් නොදැක්වූ හෙයින්, කළු කමිස හමුදාව යොදවා රෝමය වට කළ අවස්ථාවේ රජය විස්මයට පත් විය. මේ නිසා ඉතාලියේ වික්ටර් ඉමානුවෙල් රජු, ආණ්ඩුව විසුරුවා හැර, මුසෝලනී ඇමති මණ්ඩලයක් පත් කොට ගැනීමට ආරාධනා කෙළේ ය.

රාජ්‍යයට හා පාලකයාට දේවත්වයක් ආරෝපණය කිරීම, මූලික අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම, පුරවැසියන් සතු වගකීම් අවධාරණය කිරීම, රජය හා පාලකයා වෙත ජනතාව නිරතුරු ව ම පක්ෂපාතිත්වයක් දැක්වීම වැනි පැසිස්ට්වාදී මූලධර්ම ඔහු ක්‍රමයෙන් ඉතාලිය තුළ පතුරවා ආඥාදායකත්වය ස්ථාපිත කෙළේ ය.

රජයේ ප්‍රධාන තනතුරු සඳහා සිය හිතවතුන් පත් කළ මුසෝලිනී ඔහුට එරෙහි ව ඉදිරිපත් වූ සියලු විරෝධතා භීෂණය හා සැහැසිකම් මඟින් මර්දනය කෙළේ ය. ඡන්දදායකයන්ට බලපෑම් කිරීමට කළු කමිස හමුදාව යෙදවූ ඔහු පුවත් පත් මර්දනය මඟින් සිය විරුද්ධකරුවන් මෙල්ල කෙළේ ය. මෙසේ පාර්ලිමේන්තුවේ වැඩි ආසන සංඛ්‍යාවක් දිනා ගත් ඔහු සෙසු සියලු ම පක්ෂ මර්දනය කොට ඉතාලියේ වලංගු එක ම පක්ෂය පැසිස්ට් පක්ෂය බවට පත් කෙළේ ය. මේ නිසා 1929 මැතිවරණය සම්පූර්ණයෙන් දිනා ගැනීමට මුසෝලනීට හැකි විය. තමාට එරෙහි සියලු බලවේග ඔහු මුලිනුපුටා දැමී ය.

මුසෝලිනී පාප්තුමා සමඟ ඇති කර ගත් ලැටරන් ගිවිසුම මඟින් මහජනතාවගේ සහයෝගය ලබා ගැනීමට හා පාප්තුමාගේ සිත් දිනා ගැනීමට සමත් විය. එනම් ඉතාලි ජනතාවගෙන් බහුතරය උග්‍ර කතෝලිකයෝ වූහ. කතෝලික ආගම රාජ්‍ය ආගම ලෙස පිළිගත් අතර සියලු පාසල්වල ආගම ඉගැන්වීම අනිවාර්ය කරනු ලැබී ය. 1870 දී රෝමය පාප්තුමාගේ පාලනයෙන් නිදහස් කර ගත් අවස්ථාවේ සිට රජය හා පාප්තුමා අතර සම්බන්ධතා අඩු විය. එහෙත් පාප්තුමා හා මුසෝලිනී අතර ඇති කර ගත් සම්මුතිය අනුව පාප්තුමා වතිකානුවේ පාලකයා ලෙස පිළිගත් අතර පාප්තුමාට අහිමි වූ ප්‍රදේශ සඳහා විශාල වන්දියක් ද මුසෝලිනී විසින් ලබා දෙන ලදී. පාප්තුමා මුසෝලිනීගේ රාජ්‍යය නිත්‍යානුකූල බව පිළිගත්තේ ය.

**ඉතාලිය ආර්ථික අතින් ශක්තිමත් කිරීමට මුසෝලිනී ගත් ක්‍රියා මාර්ග කිහිපයකි:**

- රජයේ වියදම් අඩු කිරීම
- අතිරික්ත නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීම
- ධනවතුන්ගෙන් අධික බදු ලබා ගැනීම
- වැඩ වර්ජන හා වෘත්තිය සමිති ක්‍රියාමාර්ග තහනම් කිරීම
- කර්මාන්තකරුවන්ගේ හා කම්කරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට කටයුතු කිරීම
- කර්මාන්තවල නිෂ්පාදනය වැඩි කිරීම
- කර්මාන්තශාලාවල වැඩ කළ යුතු කාලය පැය 08ක් බව නීති ගත කිරීම
- කම්කරුවන්ගේ ජීවිත රක්ෂණය කළ දායක මුදල් ක්‍රමයක් ඇරඹීම
- දුම්රිය මාර්ග ඉදි කිරීම, වෙළෙඳ නැව් කණ්ඩායම් ගොඩ නැඟීම, වනවගාව ඉඩම් ගොඩ කිරීම වැනි නව ව්‍යාපෘති මඟින් නව රැකියා බිහි කිරීම
- සංචාරක කර්මාන්තය දියුණු කිරීම

මුසෝලිනීගේ මෙම බහුවිධ ප්‍රතිපත්තිය මඟින් යම්තාක් දුරකට ආර්ථික ජයග්‍රහණයක් ලබා ගත හැකි වූ නමුත්, 1929 ආර්ථික පරිහානියත් සමඟ එය අසාර්ථක විය. මුසෝලිනීගේ මීළඟ පියවර වූයේ, යුද්ධය මගින් ඉතාලියට ශ්‍රේෂ්ඨත්වයක් ලබා දීම යි. ඒ අනුව ජාතිවාදය සහ යුද්ධය උසස් කොට සලකනු ලැබී ය.

යුද්ධයට අවශ්‍ය පසුබිම සකස් කිරීමට ප්‍රචාරක ව්‍යාපාරයක් ක්‍රියාත්මක කළ අතර තරුණ ජනතාවට යුද සේවය අනිවාර්ය කෙළේ ය. ක්‍රි.ව. 1940 දී ජපානය හා ජර්මනිය ප්‍රධාන වූ පිළට එකතු වී දෙවන ලෝක යුද්ධයට සම්බන්ධ විය.

එහෙත් මෙම යුද්ධයේ දී, ඉතාලියට අවාසනාවන්ත පරාජයන් රැසකට මුහුණ දීමට සිදු විය. එහි ප්‍රතිඵලය වශයෙන් ඉතාලිය සතු ව පැවති සියලු ම යටත් විජිත හා සිසිලි දූපත් ද ඇයට අහිමි විය. මේ නිසා පැසිස්ට්වාදීන්ගේ කෝපය සිය නායකයා වෙත එල්ල වූ අතර, ඔහු උතුරු ඉතාලියට පලා ගියේ ය. ක්‍රි.ව. 1945 ජර්මනිය පරාජය වීමත් සමඟ මුසෝලිනී අල්ලා ගත් ඉතාලි ජාතිකයෝ මිලාන් නගරයේ දී ඔහු මරා දැමූහ.

## ජර්මනියේ නාසිවාදය

පළමුවන ලෝක යුද්ධයෙන් පසු ව ජර්මනියේ පාලනය ගෙන ගියේ වෛයිමාර් සමූහාණ්ඩුව යි. එය වසර 14ක් පමණ කාලයක් ක්‍රියාත්මක විය. එහෙත් එම කාලය තුළ ජර්මනිය ආර්ථික උද්ධමනය, විරැකියාව, ආහාර හිඟය වැනි බරපතළ ප්‍රශ්න රැසකට මුහුණ දෙමින් සිටි අතර පළමුවන ලෝක යුද්ධයේ මිත්‍ර පාක්ෂිකයන්ට ගෙවීමට සිදු වී තිබූ වන්දි මුදල් නිසා වඩාත් පීඩනයට පත් විය. වර්සේල්ස් ගිවිසුම යනු ජර්මනිය මත බලෙන් පටවන ලද එරට කීර්තිය හෑල්ලුවට පත් කිරීමක් වූ බැවින්, කෙසේ හෝ එම ගිවිසුම බිඳ දැමීම ජර්මනියේ අපේක්ෂාව විය.

**නාසිවාදය**

- ප්‍රජාතන්ත්‍රවාදය, කොමියුනිස්ට්වාදය මෙන් ම ධනවාදයට ද විරුද්ධ දර්ශනයක් වූ මෙහි මූලික ඉගැන්වීම වූයේ ජර්මන් ජාතිය නිර්මල ආර්යයන්ගෙන් පැවති එන ලෝකයේ ඉතා ම උතුම් මානව වර්ගය බව යි.
- යුදෙව්වන් හෙළා දැකීම නාසිවාදයේ විශේෂ ලක්ෂණයකි. හිට්ලර්ගේ "මයින් කාම්ෆ්" හෙවත්, මගේ සටන, කෘතියේ නාසිවාදය විස්තර කොට ඇත.
- විරුද්ධවාදීන් විනාශ කිරීම, රහස් හමුදාව මඟින් තොරතුරු රැස් කිරීම සහ කුමන්ත්‍රණ මෙම දර්ශනය තුළ දක්නට ලැබේ.
- රාජ්‍ය නායකයා ජාතියේ ආත්මීය සලකුණ වශයෙන් සලකන ලදී.
- නායකයාට අසීමිත බලතල හිමි විය යුතු වීම සහ ආර්ථික ක්‍රමය රජයේ දැඩි පාලනයට නතු විය යුතු වීම යනාදිය නාසි පක්ෂයේ ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයකි.

නාසිවාදය පළමුවන ලෝක යුද්ධයෙන් පසුව ජර්මනියේ ඇඩොල්ෆ් හිට්ලර්ගේ නායකත්වයෙන් පැන නැගුණු ආඥාදායක පාලන ක්‍රමයකි.

## හිට්ලර්ගේ නැඟීම



රූපය 4.6 ඇඩොල්ෆ් හිට්ලර් මහතා

යුද්ධ වන්දි, දරිද්‍රතාව, විරැකියාව, ආහාර හිඟය ඇතුළු ප්‍රශ්න රැසකට ජර්මනිය මුහුණ දී සිටි පසුබිම තුළ ජාතික සමාජවාදය මුවාවෙන් බලයට පත් වීමට හිට්ලර්ට අවස්ථාව උදා විය. ඔහු ඉතා කුඩා පක්ෂයක් වූ ජර්මන් කම්කරු පක්ෂයේ සාමාජිකත්වය ලබා ගත්තේ ය.

ඔහු ජාතික සමාජවාදී කම්කරු පක්ෂය යනුවෙන් එම පක්ෂයේ නම ද (නාසි) වෙනස් කෙළේ ය. එහි දර්ශනය නාසිවාදය නමින් ප්‍රකට විය. මෙම පක්ෂයට දුඹුරු කමිස හැඳගත් සන්නද්ධ කණ්ඩායමක් ද එස්.එස් නමින් හැඳින්වූ රහස් හමුදා කණ්ඩායමක් ද විය.

ස්ථිර පක්ෂ මූලස්ථානයක් පිහිටු වූ අතර "ද නැෂනල් ඔබ්සවර්" නමින් නිල පුවත් පතක් ද ආරම්භ කෙළේ ය. රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා කුමන්ත්‍රණය කිරීමේ වරදට සිරභාරයට පත් වූ හිට්ලර්, සිරභාරයේ දී "මගේ සටන" නම් කෘතිය රචනා කෙළේ ය. එය නාසිවාදයේ අත් පොත විය. චතුර කථිකයකු වූ හිට්ලර් රැස්වීම් අමතමින් ජනතාව තමා වෙත ඇද බැඳ ගැනීමට සමත් විය. ඔහුගේ කථා මඟින් කොමියුනිස්ට් පාලනය පිළිබඳ ව භීතියක් ඇති කොට ශක්තිමත් ආණ්ඩුවක අවශ්‍යතාව පිළිබඳ ව අදහස් ජනතාවට අවධාරණය කොට ඇත. හිට්ලර් විසින් ජාතියේ සතුරන් ලෙස නම් කරනු ලැබුවේ

වර්සේල්ස් ගිවිසුම, යුදෙව්වන්, මාක්ස්වාදීන් යුද්ධය හා උද්ධමනය යි. පළමුවන ලෝක යුද්ධයෙන් අහිමි වූ ප්‍රදේශ නැවත ලබා ගැනීම ද ඔහුගේ අරමුණ විය.



රූපය 4.7
ස්වස්ථික ලකුණ සහිත ජර්මන් ධජය

ජාතිකත්ව මූලධර්මය පදනම් කරගෙන පළමුවන ලෝක යුද්ධයෙන් පසු ව යුරෝපා සිතියම සකස් කරමින් නව රාජ්‍යය කිහිපයක් ද බිහි කළ නමුත් ජර්මන් ජාතිකයෝ විවිධ රාජ්‍යය තුළ විශාල සංඛ්‍යා වශයෙන් විසිරී සිටියහ. (22 පිටුවේ ඇති 4.3 සිතියම බලන්න) මෙය ජර්මන් ජාතිකත්වය නොසලකා හැරීමක් බව හිට්ලර්ගේ මතය විය. ආර්ය වර්ගයා සතු ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ මතය පෙරට ගෙන ආ ඔහු ස්වස්ථික ලකුණ සහිත ධජය ජර්මනියේ ජාතික ධජය ලෙස ප්‍රකාශයට පත් කෙළේ ය. යුරෝපය පුරා සිටින ජර්මානුවන් ජර්මනිය තුළ ඒකරාශි කළ යුතු බව ඔහුගේ පිළිගැනීම විය. ඒ අතර තමා ජර්මනියේ තුන්වන අධිරාජයා වශයෙන් හඳුන්වා ගත්තේ ය.



රූපය 4.8
මරා දමන ලද යුදෙව්වන්

හිට්ලර් ක්‍රි.ව. 1930 දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වුව ද ඉන් පරාජයට පත් විය. ක්‍රි.ව. 1932 දී ඔහු දෙවන මැතිවරණ ව්‍යාපාරයක් ආරම්භ කෙළේ ය. "හිට්ලර් ජර්මනිය පුරා" යන පාඨය ඇතුළත් දැවැන්ත ධජ පතාක ලෙළදුන් දැන්වීම් සංවිධානය කෙළේ ය. එහෙත් මෙම මැතිවරණයේ දී ද හිට්ලර්ගේ පක්ෂයට බහුතර ආසන සංඛ්‍යාවක් දිනා ගත නොහැකි විය. එසේ වුව ද ක්‍රි.ව. 1933 ජනවාරි මාසයේ දී හිට්ලර් චාන්සලර් පදවියට පත් විය. අනතුරු ව ක්‍රි.ව. 1933 මාර්තු මාසයේ දී නව මැතිවරණයක් පැවැත්වී ය. කොමියුනිස්ට් නායකයන් සිරභාරයට ගෙන, සෙසු සියලු දේශපාලන පක්ෂ තහනම් කොට ක්‍රි.ව. 1934 දී ජනතාව භීතියට පත් කළ කුරිරු පාලන ක්‍රමයක් ආරම්භ කෙළේ

ය. ඔහු රහස් පොලීසිය යොදවා විරුද්ධවාදීන් සියලු දෙනා විනාශ කර දැමී ය. සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගත් දස දහස් ගණන් මිනිසුන් වධහිංසා දී මරා දැමී ය. සිවිල් අයිතිවාසිකම් අවලංගු කළ ඔහු පුවත් පත් සහ ගුවන්විදුලිය මගින් නිදහස් අදහස් ප්‍රකාශ කිරීම් තහනම් කෙළේ ය. සියලු ආයතන තම අයිතියට පවරා ගත්තේ ය.

හිට්ලර්ගේ ජාතිකවාදී ක්‍රියාකලාපය ලෝකය දෙවන ලෝක යුද්ධයක් කරා ඇදගෙන යාමට හේතුවක් විය. එම යුද්ධයෙන් අන්ත පරාජයට පත් වූ මේ කුරිරු නායකයා 1945 මැයි මාසයේ දී ජර්මනිය මිත්‍ර පාක්ෂිකයන් අතට පත් වීමෙන් පසු සිය දිවි නසා ගත්තේ ය.

## දෙවන ලෝක මහා සංග්‍රාමය

ක්‍රි.ව. 1939 සැප්තැම්බර් මස සිට ක්‍රි.ව. 1945 අගෝස්තු දක්වා පුරා වසර හයක පමණ කාලයක් ලෝකය පුරා පැවති සංග්‍රාමය දෙවන මහා ලෝක සංග්‍රාමය ලෙස හැඳින්වේ. යුරෝපයේ රටවල් අතර ආරම්භ වූ සංග්‍රාමය ක්‍රමයෙන් ලෝක යුද්ධයක් බවට පත් විය. ආසියාවේ බලවතා ලෙස නැඟී එමින් සිටි ජපානය ක්‍රි.ව. 1941 නොවැම්බර් 07 දින ඇමරිකානු නාවික බළඇණියට පහර දීමත් සමඟ එතෙක් යුරෝපයට පමණක් සීමා වූ සංග්‍රාමය ලෝක සංග්‍රාමයක් බවට පත් විය.


## දෙවන ලෝක මහා සංග්‍රාමයට හේතු

- හිට්ලර්ගේ නැඟීම
- හිට්ලර්ගේ ක්‍රියාකලාපය
- ඉතාලියේ මුසෝලිනීගේ ක්‍රියා කලාපය
- ජපානයේ ආක්‍රමණකාරී ප්‍රතිපත්තිය
- ජාතීන්ගේ සංගමයේ දුර්වලතා

වැනි සාධක කිහිපයක් දෙවන ලෝක මහා සංග්‍රාමයට පසුබිම සකස් කරනු ලැබී ය. යුද්ධයට ආසන්නතම හේතුව වූයේ හිට්ලර් පෝලන්තය ආක්‍රමණය කිරීම යි.

## හිට්ලර් යටතේ ජර්මනිය බලවත් වීම

පළමුවන ලෝක සංග්‍රාමයෙන් අන්ත පරාජයට පත් වූ ජර්මනියට බලෙන් පවරන ලද වර්සේල්ස් ගිවිසුමත්, වෛමාර් සමූහාණ්ඩුවත් ක්‍රි.ව. 1929 දී ඇති වූ ලෝක ආර්ථික පරිහානියත් නිසා ජර්මනිය අර්බුද රැසකට මුහුණ පා තිබිණි. වර්සෙල්ස් ගිවිසුම මඟින් තමන් අවමානයට හා අසාධාරණයට පාත්‍ර වූ ජාතියක්ය යන හැඟීම සෑම ජර්මානුවකු තුළ ම පැවතිණි. මෙම ගිවිසුම නිසා ජර්මන් ජාතිය කොටස්වලට කැඩී ගියේ ය. ජර්මානුවෝ ලක්ෂ හැටකට ආසන්න පිරිසක් ඔස්ට්‍රියාව තුළ ද ලක්ෂ 30ක් චෙකෝස්ලෝවැකියාවේ ද තවත් විශාල පිරිසක් පෝලන්තයේ ද විසූහ.




**සිතියම 4.3**
**ජර්මානුවන් විවිධ රාජ්‍යවලට බෙදී ගොස් සිටි ආකාරය**


මෙවැනි කරුණු නිසා ක්‍රි.ව. 1932 පමණ වන විට ජර්මනිය යුරෝපයේ දිළිඳු ම රටක් බවට පත් විය. එම පසුබිම මත නාසි නායක ඇඩොල්ෆ් හිට්ලර්ගේ නැඟීම සිදු විය. පළමුවන ලෝක සංග්‍රාමයේ දී ජර්මනිය වෙනුවෙන් සටන් කළ සොල්දාදුවකු වූ හිට්ලර් ජර්මන් ජනතාවගේ සිතුම් පැතුම් වටහා ගැනීමට සමත් විය. ජර්මන් ජනතාව තුළ ජාත්‍යාලය නැංවීමට කටයුතු කළ ඔහු වර්සේල්ස් ගිවිසුම අවලංගු කිරීමටත් ක්‍රි.ව. 1914ට පෙර තිබූ තත්ත්වයට ජර්මනිය ගෙන ඒමටත් ජනතාවගෙන් සහයෝගය ඉල්ලා සිටියේ ය.

ජයග්‍රාහි රටවල් කෙරෙහි වෛරයෙන් සිටි ජර්මන් ජාතිකයන්ට මෙය ප්‍රබල සහ උද්වේගකර පණිවිඩයක් විය. හිට්ලර්ගේ දේශපාලන කථාවලින් වශී වූ ජර්මන් ජනයා ඔහු වටා රොක්වන්නට වූහ. යුද හමුදාවේ සහයෝගය ද ඔහුට නොමඳ ව ලැබිණි. 1933 වන විට ජර්මනියේ චාන්සලර් ධූරයට පත් වූ හිට්ලර් එවක සිටි ජනාධිපතිවරයා වූ හින්ඩන්බර්ග් මියයාමෙන් පසු එම තනතුරට ද පත් විය. එතැන් සිට නාසි ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ ඔහු විරුද්ධවාදීන් විනාශ කිරීම සඳහා ක්‍රියා කෙළේ ය. ඒ සඳහා ඔහු යොදා ගත්තේ එස්.එස් නමින් හැඳින්වූ රහස් හමුදා කණ්ඩායම් සහ "ගෙස්ටා පෝ" නම් වූ රහස් පොලීසිය යි.

- ▶ හිට්ලර්ට අවශ්‍ය වූයේ බලසම්පන්න අධිරාජ්‍යයක් ලෙස ජර්මනිය ගොඩනැංවීම යි. ඒ අනුව ඔහු කෘෂිකර්මය හා කර්මාන්ත යන අංශවල සංවර්ධනයක් ඇති කෙළේ ය. මහාමාර්ග, දුම්රිය මාර්ග, පාලම් වැනි යටිතල පහසුකම් වැඩි දියුණු කොට ප්‍රවාහන කටයුතු සංවර්ධනය කෙළේ ය.

- ▶ ජර්මනියේ දේශ සීමා පුළුල් කර ගැනීමේ ක්‍රියාවේ නිරත වූ හිට්ලර් ක්‍රි.ව. 1936 දී රයින්ලන්තය ඈඳා ගනු ලැබී ය. එසේ ම ජර්මන් ජාතිකයන් විශාල ප්‍රමාණයක් ජීවත් වූ ඔස්ට්‍රියාව කෙරෙහි ද හිට්ලර්ගේ අවධානය යොමු කෙළේ ය.

- ▶ ඔස්ට්‍රියාව සහ ජර්මනිය ඒකාබද්ධ කිරීමෙන් භෞතික සම්පත් ද මිනිස් සම්පත් ද වර්ධනය කොට ගත් හිට්ලර් ඉන් පසු අවධානය යොමු කෙළේ චෙකොස්ලෝවැකියාව දෙසට යි. චෙකොස්ලෝවැකියාවේ සුඩෙටන්ලන්තය ජර්මානුවන් විශාල ප්‍රමාණයක් ජීවත් වූ ප්‍රදේශයකි. එබැවින් එම ප්‍රදේශය ද ජර්මනියට ඒකාබද්ධ කළ යුතු බව හිට්ලර්ගේ අදහස විය.




**සිතියම 4.4**
**දෙවන ලෝක යුද්ධයට ආසන්න කාලයේ යුරෝපය**

ඒ අනුව හිට්ලර් විසින් ප්‍රකාශ කරන ලද්දේ ක්‍රි.ව. 1938 සැප්තැම්බර් 30 වැනි දිනට පෙර සුඩෙටන් අර්බුදය නොවිසඳුණහොත් චෙකොස්ලෝවැකියාව ආක්‍රමණය කරන බව යි. චෙකොස්ලෝවැකියාවේ භූමියෙන් වර්ග අඩි 11000ක් හා එහි වානේ හා යකඩ නිෂ්පාදනයෙන් 70%ක් ජර්මනියට ලබා දීමට මියුනික් සම්මේලනයේ දී තීරණය විය.

## මියුනික් සම්මේලනය

ජර්මන්-සුඩෙටන් අර්බුදයට විසඳුමක් ලබා දීම සඳහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය යන රටවල් ක්‍රි.ව. 1938 සැප්තැම්බර් 29 දින මියුනික් නුවරට රැස් වූහ.එම රැස් වීමේ දී සුඩෙටන්ලන්තයේ කොටසක් ජර්මනියට ලබා දීමට තීරණය විය.



**රූපය 4.9 පෝලන්තයේ විනාශයෙන් නටබුන් වූ දුම්රිය ස්ථානයක්**

ක්‍රි.ව. 1939 මාර්තු 15 දින ජර්මනිය මියුනික් ඇතුළු සියලු සම්මුතීන් කඩකරමින් චෙකොස්ලෝවැකියාව ආක්‍රමණය කොට එරට ජර්මනියට ඈඳා ගත්තේ ය. හිට්ලර් කෙදිනක හෝ රුසියාව ද ආක්‍රමණය කරනු ඇතැයි බිය වූ රුසියාව ක්‍රි.ව. 1939 දී හිට්ලර් සමඟ ගිවිසුමකට එළඹුණි. ජර්මනිය මෙලෙස සිය ශක්තිය තහවුරු කොට ගනිද්දී ජර්මන් විරෝධී අනිකුත් බටහිර ජාතීන් ද සංවිධානය වන ලකුණු දක්නට ලැබිණි.

මීළඟට ජර්මන් ජාතිකයන් විශාල පිරිසක් වාසය කරන්නේ ය යන පදනම මත හිට්ලර් විසින් පෝලන්තය ආක්‍රමණය කරනු ඇතැයි සැක කළ බ්‍රිතාන්‍යය එම තර්ජනයට මුහුණ දීම සඳහා ප්‍රංශය හා තුර්කිය සමඟ ගිවිසුමක් ඇති කොට ගත්තේ ය. හිට්ලර් 1939 සැප්තැම්බර් 1 දින පෝලන්තය ආක්‍රමණය කෙළේ ය. මේ නිසා **බ්‍රිතාන්‍යය හා ප්‍රංශය** පෝලන්තය ආරක්ෂා කිරීමට ගිවිස ගත් **පරිදි අගෝස්තු 03 දින ජර්මනියට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළේ ය.**

මෙම පෝලන්ත ආක්‍රමණය දෙවන ලෝක මහා සංග්‍රාමයට තුඩුදුන් ආසන්නතම සිදු වීම විය. ඉන් පසු යුද්ධයේ බිහිසුණු ගිනිදැල් ලොව පුරා විසිරී ගියේ ය.